# ස්වයං අධ්‍යයන කාර්ය පත්‍රිකා ගොනුව

# 5 පාඩම - ඝන වස්තුවල පරිමාව – Volume of solids

## පරිමාව

යම් කිසි වස්තුවක් අවකාශයේ පිහිටීම සඳහා අවශ්‍ය ඉඩ ප්‍රමාණය එම වස්තුවේ පරිමාව ලෙස හඳුන්වයි.

අපි පෙර ඉගෙනගත් දේ නැවත මතක් කරමු.

ඝනකයක පරිමාව = දිග x පළල x උස

ඝණකාභයක පරිමාව = දිග x පළල x උස

ත්‍රිකෝණාකාර ප්‍රිස්මයක පරිමාව






- **අභ්‍යාසය**

**01.** පහත දැක්වෙන එක් එක් ඝන වස්තුවේ පරිමාව සොයන්න.




**(i)**




**(ii)**




**(iii)**




**(iv)**

පතුල සමචතුරස්‍රාකාර පිරමිඩයක පරිමාව සොයමු.




$= \frac{1}{3}$ x ආධාරකයේ වර්ගඵලය x ලම්බ උස

$= \frac{1}{3}$ x 4 cm x 6 cm x 10 cm

= <u>120 $cm^3$</u>

- **අභ්‍යාසය**

**01.** පැත්තක දිග 9 cm වූ සමචතුරස්‍ර ආධාරකයක් සහිත පිරමීඩයක ලම්භ උස 5cm වේ. එහි පරිමාව සොයන්න.

**02.** සමචතුරස්‍ර පතුලක් ඇති පිරමීඩයක ලම්බ උස 15 cm වේ. එහි පරිමාව 180 $cm^3$ වේ. පතුලේ පැත්තක දිග සොයන්න.

**03.** සමචතුරස්‍රකාර ආධාරකයක් ඇති සෘජු පිරමීඩයක ආධාරකයේ පාදයක දිග $8\sqrt{3}$ cm වේ. එහි ලම්බ උස $2\sqrt{13}$ cm වේ.

**(i)**පිරමීඩයේ පරිමාව සොයන්න.

**(ii)** එහි ත්‍රිකෝණ මුහුණතක ලම්බ උස සොයන්න.

කේතුවක පරිමාව = $\frac{1}{3}\pi r^2 h$




අරය 7 cm ද උස 12 cm ද වූ කේතුවක පරිමාව සොයමු.

කේතුවක පරිමාව $= \frac{1}{3}\pi r^2 h$

$= \frac{1}{3} \times \frac{22}{7} \times 7cm \times 7cm \times 12\ cm$

$= \underline{\underline{616\ cm^3}}$

- **අභ්‍යාසය**

**01.** පාදයක දිග 18 cm වන සමචතුරස්‍රාකාර ආධාරකයක් සහිත සෘජු පිරමීඩයක් වීදුරු වලින් තනා ඇත. එහි ලම්බ උස 7cm වේ.

**(i)**එහි ඇති වීදුරු පරිමාව සොයන්න.

**(ii)** වීදුරු 1 $cm^3$ ක් 30 g නම් වීදුරු පිරමීඩයේ ස්කන්ධය සොයන්න.

**02.** පතුලේ අරය 7 cm ද ලම්බ උස 8 cm ද වූ කේතුවක පරිමාව සොයන්න.

**03.** පතුලේ විෂ්කම්භය 7 cm ද ලම්බ උස 10 cm ද වූ කේතුවක පරිමාව සොයන්න.

**04.** පතුලේ පරිධිය 44 cm වූ වෘත්තාකාර පතුලක් සහිත කේතුවක ලම්බ උස 12 වේ.

**(i)** එහි පතුලේ අරය සොයන්න.

**(ii)** පරිමාව සොයන්න.

**05.** පරිමාව 616 $cm^3$ වන ඝන වස්තුවක ලම්බ උස 6 cm වේ. එහි පතුලේ අරය සොයන්න

ගෝලයක පරිමාව $= \frac{4}{3}\pi r^3$




අරය 21 cm වූ ගෝලයක පරිමාව සොයමු.

ගෝලයේ පරිමාව $= \frac{4}{3}\pi r^3$

$= \frac{4}{3} \times \frac{22}{7} \times 21cm \times 21cm \times 21\ cm$

$= \underline{\underline{38808\ cm^3}}$

- **අභ්‍යාසය**

**01.** කේතුවක හැඩයට ගොඩගසා ඇති වැලිගොඩක පතුලේ පරිධිය 44 m වේ. එහි ඇල උස $\sqrt{74}$ m බව මැනගෙන ඇත. වැලිගොඩේ පරිමාව සොයන්න.

**02.** අරය 7 cm වන ඝන ගෝලයක පරිමාව සොයන්න.

**03.** අරය 3.5 cm වන ඝන ගෝලයක පරිමාව සොයන්න.

**04.** අරය 12 cm වූ ඝන අර්ධ ගෝලාකාර ලෝහ කොටසක් උණුකර අරය 3 cm බැගින් වූ කුඩා ලෝහ ගෝල 32 ක් සෑදිය හැකි බව පෙන්වන්න.

**05.** විෂ්කම්භය 7 cm වන අර්ධ ගෝලයක පරිමාව සොයන්න.

**06.** වක්‍ර පෘෂ්ඨ වර්ගඵලය 616 $cm^2$ වූ ගෝලයක

**(i)**අරය සොයන්න.

**(ii)** පරිමාව සොයන්න.

**07.** පැත්තක දිග 10.86 cm වන සමචතුරස්‍ර හරස්කඩක් සහිත ඝනකම 0.85 cm වන ඝනකාභ හැඩති ලෝහ කැබැල්ලක් උණුකර ලෝහ අපතේ නොයන පරිදි සමාන ඝනගෝල 3 ක් සාදනු ලැබේ.

**(i)** ගෝලයක අරය a ලෙස ගෙන $a^3 = \dfrac{10.86^2 \times 0.85}{4\pi}$ $cm^3$ බව පෙන්වන්න.

**(ii)** $4\pi = 12.55$ ලෙස ගෙන ලඝුගණක වගු භාවිතයෙන් $a^3$ හි අගය සොයන්න.

**(iii)** $a^3$ හි අගය ආසන්න පූර්ණ සංඛ්‍යාවට වටයා ගෝලයේ අරය සොයන්න.

**08.** **(i)** පතුලේ අරය 7 cm ද උස 15 cm ද වන සෘජු වෘත්ත සිලින්ඩරාකාර භාජනයක 10 cm උසට ජලය පිරී ඇත. එම ජල පරිමාව ගණනය කරන්න. $\left(\pi = \dfrac{22}{7}\right)$ ලෙස ගන්න.

**(ii)** අරය a cm වන කුඩා ඝන ලෝහ ගෝල 18 ක් ඉහත භාජනයට දැමූවිට එහි ජල මට්ටම h ප්‍රමාණයකින් ඉහළ යයි. $h = \dfrac{24a^2}{49}$ cm බව පෙන්වන්න.

**(iii)** $a = 1.75$ වන විට h හි අගය ලඝු ගණක භාවිතයෙන් දශමස්ථාන එකකට සොයන්න.